# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

# දැන්වීමයි

**2023 (2024) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ නැවත සමීක්ෂණ ප්‍රතිඵල සහ අත්හිටවූ ප්‍රතිඵල නිකුත් වීම මත විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයැදුම් කිරීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගෙන් 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම**

2024 සැප්තැම්බර් මස 4 වැනි දින නිකුත් කරන ලද 2023 (2024) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ නැවත සමීක්ෂණ ප්‍රතිඵල මත මෙන්ම විභාග දෙපාර්තමේන්තුව විසින් අත්හිටුවීමෙන් පසුව නිකුත් කර ඇති ප්‍රතිඵල මත 2023/2024 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයැදුම් කිරීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගෙන් **2024 ඔක්තෝම්බර් මස 1 දින සිට 2024 ඔක්තෝම්බර් මස 8 වැනි දින දක්වා** අන්තර්ජාලය ඔස්සේ අයදුම්පත් කැඳවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත.

අයදුම්පත් යොමු කිරීම සම්බන්ධව වැඩිදුර විස්තර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි (www.ugc.ac.lk) 2023/2024 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශයට අදාළ අයදුම්පත් කැඳවීම හා සම්බන්ධව මින් පෙර පළ කරන ලද පුවත්පත් නිවේදනයෙහි දක්වා ඇත.

**වැදගත්**

පාඨමාලා සඳහා වන කැමැත්තේ අනුපිළිවෙළ වෙනස් කිරීම සඳහා 2023/2024 අධ්‍යයන වර්ෂයේ අයදුම්කරුවන් සඳහා මින් පෙර ලබා දෙනු ලැබූ සති දෙකක කාලය මෙම අවස්ථාව සඳහා අදාළ නොවන බව දන්වා සිටිමි.

තව ද, ඉහත සඳහන් කර ඇති අයුරින් 2023/2024 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්පත් යොමු කිරීමට ලබා දී ඇති අවස්ථාව අදාළ විශ්වවිද්‍යාල/ මණ්ඩපය/ උසස් අධ්‍යාපන ආයතනය මඟින් පවත්වා අවසන් කළ යෝග්‍යතා/ ප්‍රායෝගික පරීක්ෂණ පවතින අධ්‍යයන පාඨමාලා සඳහා අයැදුම් කිරීමට අදාළ නොවන බව ද මෙයින් දන්වා සිටිමි.

සභාපති<br>
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව<br>
2024.10.01